කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre

**2024 දෙසැම්බර් මස 07 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2024 දෙසැම්බර් මස 07 දින උදෑසන 05.30 ට නිකුත්කරන ලදි.**

**නැගෙනහිර තරංගාකාර කැළඹිලි ස්වභාවයක් ඉදිරි දිනවලදී දිවයිනේ කාලගුණ තත්ත්වය කෙරෙහි බලපෑම් ඇතිකිරීමේ හැකියාවක් පවතී. මෙම බලපෑම හේතුවෙන් දෙසැම්බර් 10 දින සිට උතුරු සහ නැගෙනහිර පළාත්වල වැසි තත්ත්වයේ වැඩි වීමක් අපේක්ෂා කෙරේ. මේ සමග දිවයින හරහා ඊසානදිග මෝසම් තත්ත්වයද ක්‍රමයෙන් ස්ථාපිත වෙතැයි බලාපොරොත්තුවේ.**

උතුරු සහ නැගෙනහිර පළාත්වල වැසි වාර කිහිපයක් ඇති වේ.

බස්නාහිර, සබරගමුව සහ දකුණු පළාත්වලත් නුවරඑළිය සහ මහනුවර දිස්ත්‍රික්කවලත් සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේ තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක.

සෙසු ප්‍රදේශවල ප්‍රධාන වශයෙන් වැසි රහිත කාලගුණ තත්ත්වයක් පවතී.

දිවයිනේ බොහෝ ප්‍රදේශවල උදෑසන කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් පැවතිය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මගින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

## WEATHER FORECAST FOR 07 DECEMBER 2024
**Issued at 05.30 a.m. on 07 December 2024**

**An easterly wave type disturbance will be affecting the weather conditions in the island in next few days. Under its influence, showery conditions are expected to enhance in the Northern and Eastern provinces from 10th December. The Northeast monsoon condition also expected to establishing gradually over the island along with above condition.**

Several spells of showers will occur in Northern and Eastern provinces.

Showers or thundershowers may occur at several places in Western, Sabaragamuwa and Southern provinces and in Nuwara-Eliya and Kandy districts during the evening or night.

Mainly fair weather will prevail elsewhere.

Misty conditions can be expected in most places of the island during the morning.

**The general public is kindly requested to take adequate precautions minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය
2024 දෙසැම්බර් මස 07 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.

| |
|---|
| **දකුණු බෙංගාල බොක්කේ මධ්‍යම ප්‍රදේශයේ අඩු පීඩන කලාපයක් දෙසැම්බර් 07 වැනිදා පමණ වන විට නිර්මාණය වීමට ඉඩ ඇත. මෙම පද්ධතිය බටහිර-වයඹ දෙසට ගමන් කර දෙසැම්බර් 12 වැනි දින පමණ වන විට ශ්‍රී ලංකා - තමිල්නාඩු වෙරළට ඔබ්බෙන් නිරිත දිග බෙංගාල බොක්ක වෙත ළඟා වීමට ඉඩ ඇත. බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ කටයුතු සිදුකරන නාවික සහ ධීවර ප්‍රජාවන් මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඉදිරි අනාවැකි සහ නිවේදන පිළිබඳව අවධානයෙන් පසුවන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.** |
| **වැසි තත්ත්වය:** |
| මඩකලපුව සිට ත්‍රිකුණාමලය හරහා කන්කසන්තුරය දක්වා වන මුහුදු ප්‍රදේශවල ස්ථාන ස්වල්පයක වැසි ඇති වේ. කළුතර සිට ගාල්ල හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල ස්ථාන ස්වල්පයක සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක. |
| **සුළඟ:** |
| දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං ඊසාන දිශාවෙන් හමයි. සුළං වේගය **පැ.කි.මී. (30-40)** පමණ වේ. |
| **මුහුදේ ස්වභාවය:** |
| දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සාමාන්‍ය ස්වභාවයේ සිට මද වශයෙන් රළු වේ . **ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.** |

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS

**Issued at 05.30 a.m. on 07 December 2024**

| |
|---|
| **A Low-Pressure area is likely to form over central parts of south Bay of Bengal around 07th December. The system is likely to move west-northwestwards and reach over southwest Bay of Bengal off Sri-Lanka – Tamil Nadu coasts around 12th December. Navel and fishing communities, engaging activities over South-west Bay of Bengal are requested to be attentive to the future forecasts and bulletins issued by the Department of Meteorology in this regards.** |
| **Condition of Rain:** |
| Showers will occur at a few places in the sea areas extending from Batticaloa to Kankasanthurai via Trincomalee. Showers or thundershowers will occur at a few places in the sea areas off the coast extending from Kaluthara to Hambantota via Galle during the evening or night. |
| **Winds:** |
| Winds will be North-easterly in direction in the sea areas around the island. Wind speed will be **(30-40) kmph**. |
| **State of Sea:** |
| The sea areas around the island will be slight to moderate. **Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.** |

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි